# 2. විශිෂ්ට වූ සේවකත්වය

**සකළ ලෝ වැසි ජනතාවගේ ගැලවුම්කරුවාණන් ලෙස ජේසුස් වහන්සේගේ ලොව පහළ වීම සිදු වූයේ දේව සැලැස්මට අනුකූලව ය. ජේසුස් වහන්සේ පිළිසිඳ ගැනීමේ සිට උන්වහන්සේ විසින් සිදු කළ මෙහෙවර, කුරුසිපත් වීම, උත්ථානය යන මේ සියළු සිදුවීම් ද දිවැසිවරුන් ප්‍රකාශ කළ ලෙස ම සිදුවිය. මෙලෙස මිනිසා පාපයෙන් මුදවා ගැලවීම අත් කර දීම උදෙසා වූ ජේසුස් වහන්සේගේ විශිෂ්ට වූ මෙහෙවර පිළිබඳ ව පළ වූ දිවැස්වැකි කීපයක් මෙම පාඩමෙන් විමසා බලමු.**

යෙසායා 40:3-4, 42:4, 53:4-5, 61:1, මලාකි 3:1

පලස්තීනය රෝම අධිරාජ්‍යයට යටත් ව සිටිය දී ඔවුන් ගෙන ගිය කෲර පාලනයට එරෙහි ව කටයුතු කළ විවිධ සමාජ කණ්ඩායම් මර්දනය කිරීමට රෝම පාලකයෝ දැඩි පියවර ගත්හ. එකිනෙකාගේ ගැටුම්වලට මැදි වූ අහිංසක ජනතාව දැඩි පීඩනයට ද අසහනයට ද පත්ව සිටියෝ ය. තම දේශයට සාමය, විමුක්තිය උදාවන තෙක් ඔවුහු නොඉවසිල්ලෙන් බලා සිටියෝය. මෙකී පීඩාවන්ගෙන් තමන් මුදවා ගැනීම පිණිස "මෙසියස්වරයාණන්ගේ" පහළ වීම අපේක්ෂාවෙන් ඔවුහු පසු වූහ. දිවැසිවරුන් විසින් "මෙසියස්වරයාණන්ගේ" පැමිණීම පිළිබඳ ව ප්‍රකාශ කර තිබූ බැවින් ජනතාව ද තම විමුක්තිදායකයාගේ පැමිණීම පිලිබඳ ව නොඉවසිල්ලෙන් බලා සිටියහ. ඔවුන් බලාපොරොත්තු වූ ලෙසට "මෙසියස්" එනම් ආලේප ලත් තැනැන්වහන්සේගේ පැමිණීම ජේසුස් වහන්සේගේ උපත මගින් සිදු විය. මෙලෙස දිවැසිවරුන් පෙර කලක දී ප්‍රකාශ කළ දිවැස්වැකි සනාථ විය.

ජේසුස් වහන්සේ විසින් සිදු කිරීමට නියමිත මෙහෙවර උදෙසා ඊට මග පිළියෙල කිරීමට උන්වහන්සේට ප්‍රථම පැමිණි ස්නාවක ජොහාන්තුමා පිළිබඳ ව ද ස්නාවක ජොහාන්තුමා විසින් ජේසුස් වහන්සේ පිළිබඳ ව ප්‍රකාශ කළ අනාවැකි ද සලකා බලමු.

**ස්නාවක ජොහාන්ගේ සේවය පිළිබඳ මලාකි දිවැසිවරයා ප්‍රකාශ කළ දිවැස්වැකි.**

***මට පෙරටුව ගොස් මාගේ මාර්ගය පිළියෙල කරන්නා වූ***
***මාගේ දූතයා මට පෙරටුව එවන්නෙමි.***
***එවිට නුඹලා සොයමින් සිටින සමිඳාණන් වහන්සේ***
***හදිසියෙන් තමන් දේව මාලිගාවට වඩින සේක.***
***නුඹලා පුල පුලා බලා සිටි දේව දූතයා පැමිණ***
***මාගේ ගිවිසුම ප්‍රකාශ කරනු ඇත.***
***මලාකි 3:1***

මෙම දිවැස් වැකියෙන් ස්නාවක ජොහාන්තුමා සමිඳුන්ට පෙරටුව ගොස් ජනතාවට දේව රාජ්‍යය පිළිගැනීමට මග පිළියෙල කරන බව මලාකි දිවැසිවරයා විසින් ප්‍රකාශ කර ඇත.

දිවැසිවර යෙසායා ස්නාවක ජොහාන් පිළිබඳ ව ප්‍රකාශ කළ දිවැස්වැකි මෙ ලෙසිනි.

**මෙසේ කියන හඬට සවන් දෙන්න.**
**වනාන්තරයේ සමිඳුන් හට මාවතක් එළි කරන්න.**
**පාළුකරයේ අපේ දෙවිඳුන් හට මහ පාරක් සාදන්න.**
**සියළු මිටියාවත් පුරවනු ලබන්නේ ය.**
**සියලු කඳු හෙල් කපා පහත් කරනු ලබන්නේ ය.**
**සියළු හෙල් සමතලා කරනු ලබන්නේ ය.**
**රළු තැන් සුමුදු කරනු ලබන්නේ ය.**
**යෙසායා 40:3-4**

මේ වන විට සමකාලීන ජුදෙව් සමාජය පුරා දූෂණය හා වංචාව ඉහවහා ගොස් පැවතුණි. සමාජයේ වරප්‍රසාද ලද්දන් විසින් දිළින්දන් ද පව්කරුවන් සේ සලකා සමාජයෙන් කොන් කරනු ලැබූවන් ද දැඩි පීඩනයට ලක් කරමින් ක්‍රියා කළ හ. මෙම අසාධාරණය වටහා දෙමින් සමාජයෙන් ප්‍රතික්ෂේප කරනු ලැබූවන් සමානාත්මතාවයෙන් පිළිගනිමින් ජේසුස් වහන්සේ ගේ මෙහෙවරට අවශ්‍ය පසුබිම සූදානම් කිරීමේ වගකීම ස්නාවක යොහාන් වෙත පැවරෙන බව මෙම දිවැස්වැකියෙන් ප්‍රකාශ වේ.

ඉහත ප්‍රකාශ කරන ලද දිවැස් වැකි සත්‍යයක් බවට පත් විය. එසේ වූයේ ස්නාවක ජොහාන්තුමාගේ විශිෂ්ට වූ සේවාව තුළිනි. ඔහු විසින් එදා සමාජය තුළ සිටියා වූ සැම ජන කොටසක් කෙරෙහි ම අවධානය යොමු කරමින් ඔවුන් තුළ තිබුණා වූ දුර්වලතා පෙන්වා දුන්නේ ය. අභියෝගාත්මක දේශනා මගින් සියළු ජන කොටස් අමතමින් ඔවුන් අතර තිබුණා වූ අයුක්ති සහගත හා අසාධාරණ ක්‍රියා පිළිබඳ ව ඔවුන්ට අවබෝධ කර දුන්නේ ය.

## ජේසුස් වහන්සේගේ සේවය පිළිබඳ විශිෂ්ටත්වය ප්‍රකාශ කරන දිවැස් වැකි.

**සැබවින් ම යුක්තිය ඉටු කරන්නේ ය. එතුමා**
**කලකිරෙන්නේ වත් අධෛර්ය වන්නේවත් නැත.**
**මිහිපිට යුක්තිය පිහිටුවන තුරු එතුමාගේ දහම්**
**මග උදාවන තුරු දිවයින් බලා සිටිනු ඇත.**
**යෙසායා 42:4**

තම මෙහෙවරේ දී දේව පුත්‍රයාණන් හට මුහුණ දීමට සිදු වන අභියෝගත් ඒවාට උන්වහන්සේ මුහුණ දෙන ආකාරය ත් මෙම දිවැස්වැකියෙන් පෙන්වා දෙයි. ජේසුස් වහන්සේ සැම විට ම ක්‍රියා කළේ යුක්ති සහගතව ය. අයුක්ති සහගත ව ජනතාව පෙලූ රෝම අධිරාජ්‍ය නිලධාරීන්ටත් ඔවුන්ට ගැති කම් කරන ලද අයකැමියන්, පරිසිවරුන්, ලියන්නන් වැනි ආගමික කණ්ඩායම්වලට අයත් වූවන්ට ත් යුක්ති සහගත ව ක්‍රියා කරන ආකාරය එඩිතර ව පෙන්වා දුන් උන්වහන්සේ සැම විට ම ඉවසීමෙන්, ප්‍රේමයෙන් හා සාධාරණ ව කටයුතු කළ සේක. ජේසුස් වහන්සේ තුළ තිබුණා වූ මෙම සුවිශේෂී ගුණාංග අප ජීවිතවලට ද මහත් ආදර්ශයකි. විවිධ කටුක අත් දැකීම් තුළ කලකිරීමට පත් නොවී දෙවි සමිඳුන්ගේ මහත් කැපවීම හා ඉවසීම සිහි කරමින් ධෛර්යයෙන් යුතු ව අප කැඳවා ඇති මෙහෙවරේ යෙදෙන්නට අප හට ද කෙරෙන මග පෙන්වීමකි මෙය.

මෙම දුක් උසුලන සේවකයාණෝ දුක දරාගනු ලැබුවේ අප වෙනුවෙන් බව ඔබ දන්නවා

**එතුමාණෝ ඉසුළුවේ අපේ දුක ය.**
**දරාගත්තේ අපේ පීඩා ය.**
**වේවා දඬුවම් යැයි අපට සිතුණේ ය.**
**එහෙත් එතුමන් තුවාල ලැබුවේ අපේ අපරාධ නිසා ය.**
**පොඩි කරනු ලැබුවේ අපේ පව් නිසා ය.**
**එතුමන් ලත් දඬුවමින් අපට සමාදානය ලැබී ඇත.**
**එතුමන් ලැබූ පහරවලින් අපට සුවය ලැබී ඇත.**
**යෙසායා 53:4-5**

දිවැසිවර යෙසායාගේ මෙම අනාවැකියෙන් ජේසුස් වහන්සේ මිනිස් වර්ගයාගේ පාපය වෙනුවෙන් සිදු කිරීමට නියමිත මහත් පූජාව ගැන පවසයි. අන් අය උදෙසා දුක් විඳින්නට, පීඩා විඳින්නට ඉදිරිපත් වූ එතුමාණෝ පාපයේ මිල ගෙවූ බැටළු පෝතකයාණෝ බවට පත් ව සියල්ලන්ගේ පව් තමා පිටට පවරා ගත් සේක. ස්නාවක ජොහාන්, ජේසුස් වහන්සේ තම අනුගාමිකයන්ට හඳුන්වා දුන්නේ "ලෝකයේ පව් දුරු කරන දෙවියන්ගේ බැටළු පෝතකයාණෝ" ලෙස ය. ඒ අපගේ පව් වෙනුවෙන් තම ජීවිතය පූජා කොට අප පාපයෙන් නිදහස් කළ නිසා ය. අසාධාරණයට, ප්‍රතික්ෂේපයට ලක්ව සිටි "පව්කරුවන්" ලෙස හැඳින් වූ අය වෙනුවෙන් උන්වහන්සේ පෙනී සිටි සේක. එබැවින් එදා ජුදා සමාජයේ වරප්‍රසාද ලත් ඇතැම් පිරිස් තමන්ගේ පැවැත්මට තර්ජනයක් බැවින් උන්වහන්සේට වරද තබමින් අධිකරණය ඉදිරියට පමුණුවනු ලැබුවෝ ය.

ජේසුස් වහන්සේ අත කිසිදු වරදක් නොමැති වුව ද, ජුදා අධිකරණයෙන් උන්වහන්සේ වරදට පත් කොට, කුරිරු ලෙස කුරුසිය මත ඇණ ගසද්දී ත් මේ සියල්ල විඳ දරා ගනිමින් ඔවුන්ට කමාව දුන් සේක.

තවද ජේසුස් වහන්සේගේ සේවකත්වය පිළිබඳ පිලිප් විසින් එතියෝපීය නපුංසකයාට පහදා දුන් ශුද්ධ ලියවිලි පාඨය තුළින් ද උන්වහන්සේගේ පරිත්‍යාගශීලී බව පැහැදිලි වේ.

**"මරන්න ගෙන යන බැටළුවකු මෙන් ද උගේ ලොම් කපන්නා ඉදිරිපිට**
**ගොළුව සිටින බැටළුවකු මෙන් ද උන්වහන්සේ මුඛය නාරින සේක.**
**උන්වහන්සේ නින්දා ලැබූ හ. යුක්තිය නොලැබූ හ."**
**ක්‍රියා 8 : 32-33**

මෙම ජීවිත පූජාවෙන් උන්වහන්සේ මිනිසාගේ ජන්ම පාපය නිසා දෙවියන් වහන්සේ හා මිනිසා අතර පළුදු වූ දේව සබඳතාවය නැවත ස්ථාපිත කළ සේක.

දේව සැලසුමට අනුකූල ව ජේසුස් වහන්සේ මාංශ ගත වූයේ අරමුණු කීපයක් පෙරදැරි කරගෙන ය. ඒ පිළිබඳ ව විමසා බලමු.

**මහෝත්තම දෙවි සමිඳුන්ගේ ආත්මානුභාවය මා කෙරෙහි ඇත.**
**දිළිඳුන්ට සුබ අස්න දෙසීමට ද බිඳුනු සිත් ඇත්තන්ට සුව සෙත දීමට ද**
**වහලුන්ට මිදීම දානය කරන්නට ද සිරකරුවන්ට නිදහස දක්වන්ට ද**
**එතුමාණෝ මා ආලේප කළ සේක.**
**යෙසායා 61 : 1**

ජේසුස් වහන්සේ ලොව පහළ වීමට ශත වර්ෂ ගණනාවකට පෙර යෙසායා දිවැසිවරයා විසින් ජේසුස් වහන්සේගේ මෙහෙවර පිළිබඳ අනාවැකි එලෙස පළ කර තිබුණි. නාසරෙත් ධර්ම ශාලාවේ දී එම අනාවැකිය සම්පූර්ණ කරමින් තම ප්‍රථම දේශනය තුළින් උන්වහන්සේගේ සේවයේ ආරම්භක පියවර තැබූ සේක. තමා ආලේප කර ඇත්තේ දිළිඳුන්ට සුබ අස්න දේශනා කිරීමට බව ප්‍රකාශ කළ සේක. දිළිඳුන් යනු වහලුන්, පීඩිතයින්  වැනි අය යි. එකල ආගමික නායකයින් ලෙස කටයුතු කළවුන් දිළින්දන් ලෙස සලකනු ලැබූ අය හට ආගමික වත් පිළිවෙත්වල යෙදීමට පවා අවසර නොදුන්හ. නමුත් ජේසුස් වහන්සේ ලද සැම අවස්ථාවක දී ම දිළිඳුන්ට සුබ අස්න පිළිගැන්වීමට යුහුසුලු වූ සේක. ලාදුරු රෝගය වැනි රෝග හේතුවෙන් සමාජය විසින් පිළිකුල් කරන ලද රෝගීන්ට ජේසුස් වහන්සේ සුව සෙත දානය කළ සේක. තම වරද පිළිගෙන පවින් මිදීමට ජේසුස් වහන්සේගේ සරණ පැතූ පව්කාර ස්ත්‍රියට ද මුදලට වහල් වී අසාධාරණ ලෙස ධනය රැස් කළ සාකෙවුස් නම් අය කැමියාට ද මිදීම අත්කර දුන් සේක. මෙලෙස තම සේවය තුළින් ජීවමාන ආදර්ශ ලබා දුන් උන්වහන්සේ සේවය ලැබීමට නොව සේවය කිරීමට අපට ද ආරාධනා කරන සේක.

ක්‍රියාකාරකම

1. ස්නාවක ජොහාන්තුමාගේ සේවය පිළිබඳ දිවැස්වැකි සම්පූර්ණත්වයට පැමිණි අවස්ථා 3 ක් ගෙනහැර පාන්න.

2. ජේසුස් වහන්සේ පිළිබඳ ව පැරණි ගිවිසුමේ ප්‍රකාශිත දිවැස් වැකි නව ගිවිසුම තුළින් ඉටු වූ අවස්ථා පැහැදිලි කරන්න.